ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

චක්‍රලේඛ අංක: PS/DSP/03/16

2016 මැයි මස 04 වන දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්
සියළුම පළාත් පාලන ආයතන ප්‍රධානීන්
සියළුම රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්
සියළුම රාජ්‍ය සමාගම්වල සභාපතිවරුන්

## ජගත් පරිසර දින සැමරුම් වැඩසටහන - 2016 ජූනි 05

1972 වර්ෂයේ ස්ටොක්හෝම් නුවර පැවති ජාත්‍යන්තර පරිසර සමුළුවේදී ගන්නා ලද තීරණයකට අනුව බිහිවූ එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනේ (UNEP) සමාරම්භක දිනය සැමරීම උදෙසා සෑම වසරකම ජූනි 05 වන දින "ජගත් පරිසර දිනය" වශයෙන් නම් කරන ලදී. ඒ අනුව පරිසර සංරක්ෂණය පිළිබඳව ලෝකවාසී ජනතාව දැනුවත් කිරීමේ හා විවිධ පරිසර ගැටළු පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අවධානය යොමු කරවීමේ අරමුණින් සෑම වසරකම ජූනි මස 05 වන දින "ජගත් පරිසර දිනය" සමරනු ලබයි.

02. ලෝකයේ දැනට වෙසෙන බිලියන 07ක ජනගහනය ඉදිරියේදී තවත් වේගයෙන් වර්ධනය වනු ඇත. ඒ අනුව, ඔවුන්ගේ අවශ්‍යතා ද දිනෙන් දින වැඩි වනු ඇත. මේ නිසා සිදුවන විශාල සංවර්ධන ව්‍යාපෘති, අවිධිමත් පරිභෝජනය සහ නීති විරෝධී වනසත්ත්ව හා ශාක ජාවාරම් මෙන්ම, ගිනි තැබීම් හා ලැව්ගිනි හේතුවෙන්ද ලෝකයේ පවතින වනගහනය හා වනසත්ත්වගහනය ඉතා වේගයෙන් අඩුවෙමින් පවතී. ඇතැම් ජීවී විශේෂ වඳවීමේ තර්ජනයට ද ලක් වී ඇත. වනාන්තර විනාශය, වායු ගෝලයේ කාබන් ඩයොක්සයිඩ් ඇතුළු හරිතාගාර වායු අධිකවීම ආදී කරුණු හේතු කොටගෙන ගෝලීය උණුසුම ඉහළ යාම නිසා අද වන විට ලෝකය දේශගුණික විපර්යාසවලට මුහුණ දෙමින් සිටී. මේ පිළිබඳව දැඩි අවධානයක් යොමු නොකළහොත් මිනිසා ඇතුළු සමස්ත සත්ත්ව සංහතියම නුදුරු අනාගතයේදී ගැටළු රැසකට මුහුණ දෙනු ඇත. එබැවින් වනසම්පත හා වනජීවීන් සුරැකීමත්, වන ව්‍යාප්තිය වැඩිකිරීමත්, ජෛව විවිධත්වය ආරක්ෂාකරගනිමින් පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් මගින් මෙම ගැටළුවලට යම්තාක්දුරට විසඳුම් ලබාදිය හැකිය. මේ පිළිබඳව ලෝකවාසී ජනතාවගේ දැඩි අවධානය යොමු කිරීම පිණිස "වනජීවී සම්පත් නීතිවිරෝධී ලෙස අලෙවි කිරීමට එරෙහි වෙමු" (FIGHT AGAINST THE ILLEGAL TRADE IN WILDLIFE) යන තේමාව යටතේ 2016 වසරේ ජගත් පරිසර දිනය ලොව පුරා සමරනු ලබයි.

ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones: ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax: ++ 94 11 2446657
ඉ-තැපෑල / மின்-அஞ்சல் / e-mail: prsec@presidentsoffice.lk